**හබරාදූව ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හබරාදූව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ආදායම් හා පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී වූ ලද වට්ටම පිළිවෙලින් රු.1,475,000 ක් හා රු.225,112 ක් ගිණුම් ගත කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී වූ රු.184,614 ක වට්ටම් සමුච්චිත අරමුදලට හා වෙනත් ආදායම් ගිණුමට යන ගිණුම් දෙකටම බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.184,614 කින් වැඩි වී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඇ) | මුළු අවසන් තොග ශේෂ වටිනාකම රු.151,802 ප්‍රාග්ධන ණයහිමි වටිනාකම රු.4,673,931 ක් අඩුවෙන් ද වියදම රු.23,073,552 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඉ) | සභාවේ වාහන නඩත්තු ඒකකය සඳහා මිලදී ගත් වටිනාකම රු.441,868 ක යන්ත්‍ර හා උපකරණ 16 ක් හා රු.3,419,000 ක් වටිනා ට්‍රැක්ටර් රථය ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, වාහන නඩත්තු වියදම වූ රු.367,494 ක් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ඉකුත් වර්ෂයේ වියදම් ණයහිමියන් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමේ දී රු.186,220 ක් වියදම් ණයහිමියන් වැඩියෙන් හා සමුච්චිත අරමුදල අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි අගයෙන් ණයහිමි ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (උ) | ණයහිමියන් සඳහා රු.3,884,187 ක් අඩුවෙන් ප්‍රතිපාදන ඇතිකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි අගයෙන් ණයහිමි ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ඌ) | දේපළ පිරියත සහ උපකරණ ගිණුම්වල ශේෂය හා ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් හා ආධාර මඟින් දායක වීමේ ගිණුමේ ශේෂය අතර රු.184,615 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්වල ශේෂ සමඟ සමාන විය යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.14,670,306 ක වෙනසක් පැවතිණි. | ශේෂ අතර වෙනස නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගිණුම හා උපලේඛන අතර පවත්නා අසමානතාවයන් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.7,090 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය නිරවුල් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කරගත යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.52,928,885 ක් වූ ගිණුම් විෂයයන් 22 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිවැරදි උපලේඛන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය | 2010 වර්ෂයේ සිට ඉදිකරන ලද පාරවල් ගැසට් කිරීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගැසට් නොකරන ලද පාරවල් සියල්ලම කඩිනමින් ගැසට් කිරීමට කටයුතු කරන බව. | සභාව මඟින් ඉදිකළ පාරවල් ගැසට් කර ප්‍රකාශයට පත් කළ යුතුය. |
| (ආ) | i. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 316 හා 1988 ප්‍රාදේශීය සභා රීති 19 | උප පත්‍රිකා පොත් හා මූලා වටිනාකමක් ඇති වෙනත් පෝරම සුරක්ෂිතව ලේකම්වරයා භාරයේ පැවතිය යුතු නමුත්, ඊට පටහැනිව රු.3,966,990 ක් වටිනා ටිකට්පත් 76949 ක් හා ලදුපත් හා උප ලදුපත් 7850 ක් කළමනාකරණ සේවා නිලධාරියෙකුට භාර දී තිබුණි. | ලදුපත් හා උප ලදුපත් වෙනම ආරක්ෂිතව ගබඩා කර තබා ගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇති බව. | මූල්‍යාමය වටිනාකමක් ඇති පොත් ආරක්ෂිතව තබා ගත යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර දෙකක කාලය ඉක්මවා තිබූ සියයට 10 ක රැඳවුම් රු.487,810 ක් සභා ආදායමට ගැලපීම් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |
| (ඇ) | 2010 දෙසැම්බර් 27 දිනැති 2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 05 වන වගන්තිය. | ගිවිසුම කල් ඉකුත් වූ කඩ කාමර 39 ක් පැවති අතර, ගිවිසුම් අළුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම්ගත නොවන කඩ කාමර මුද්‍රා තැබීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | කඩ කාමර ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කළ යුතුය. |

### 1.7.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම සඳහා සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, ඉන්ධන වෙනුවෙන් රු.296,968 ක් ගෙවීම් කර තිබුණි. | කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අවශ්‍ය වන නිලධාරීන් මෙම කාර්යාලයේ නොමැති බව. | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.39,723,912 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.68,083,412 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 19,025,000 | 18,919,067 | 19,673,584 | 31,249,409 | 17,530,298 | 17,117,787 | 13,581,262 | 32,003,926 |
| කුලී | 5,873,000 | 2,593,077 | 1,631,732 | 5,041,325 | 7,225,500 | 8,225,721 | 5,887,922 | 4,079,980 |
| බලපත්‍ර ගාස්තු | 10,000,000 | 9,489,752 | 9,516,052 | 30,400 | 12,126,190 | 9,055,168 | 9,064,668 | 56,700 |
| වෙනත් ආදායම් | 19,415,000 | 30,882,385 | 30,882,385 | 522,822 | 10,800,500 | 83,226,398 | 83,226,398 | 522,822 |
| | 54,313,000 | 61,884,281 | 61,703,753 | 36,843,956 | 47,682,488 | 117,625,074 | 111,760,250 | 36,663,428 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.36,663,428 ක් වූ අතර, වර්ෂ අවසානයට එය රු.36,843,956 ක් විය. | අයවිය යුතු මුළු ආදායම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.31,170,219 ක හිඟ වරිපනම් බදු ශේෂය තුළ වසර 03 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පවතින රු.4,080,228 ක හිඟ ශේෂයක් පැවතිණි. ප්‍රධාන කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ වරිපනම් බදු දේපල 6845 ක් පැවති අතර, ඉන් දේපල 4921 ක් සඳහා කිසිදු බදු මුදලක් ගෙවා නොතිබූ අතර, එම දේපලවලින් රු.13,969,998 ක බදු මුදලක් අය වීමට පැවතුණි. | හිඟ මුදල් ද කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීනව අය නොවී පවතින ශේෂ අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට මුළු හිඟ බදු කුලී ආදායම රු.4,079,980 ක් වූ අතර, වර්ෂ අවසානයට එය රු.5,041,325 ක් විය. | අයවිය යුතු මුළු ආදායම අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ඈ) | ජෝව් ආපන ශාලාව වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු.98,256 ක හිඟ බදු මුදල සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | දීර්ඝකාලීනව හිඟව පවතින ශේෂ අයකර ගත යුතුය. |
| (ඉ) | කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුමෙහි 03 වන වගන්තිය ප්‍රකාරව කඩ කාමර 85 කින් අය නොවී පවතින හිඟ ආරක්ෂිත ඇප මුදල රු.1,534,200 ක් වූ අතර, එම මුදල අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | ඇප මුදල් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| ඊ) | සභා සීමාව තුළ සවිකර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 169 ක් වෙනුවෙන් රු.1,272,795 ක ගාස්තුවක් අය කරගෙන නොතිබුණි. | 2024 වර්ෂය සඳහා ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | දැන්වීම් පුවරු වලින් අදාළ ගාස්තු අය කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ කසළ බදු අය කරන ලියාපදිංචි ආයතන 126 කින් ආයතන 61 ක් සඳහා රු.1,854,275 ක හිඟ ආදායමක් අය වීමට තිබූ අතර, එය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | කඩිනමින් හිඟ කසළ බදු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කසළ ගාස්තු අය කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කොග්ගල නිදහස් වෙළඳ උද්‍යානය හා ජෝව් උද්‍යානය 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොවීම නිසා ඊට අදාලව මුද්‍රණය කරන ලද රු.3,966,990 ක් වටිනා ටිකට්පත් 7850 ක් නිෂ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියා කටයුතු අවසන් වූ පසු ටිකට්පත් භාවිතා කර ආදායම් ඉපයීමට කටයුතු කරන බව. | අළුත්වැඩියා කටයුතු කඩිනම් කර ආදායම් ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ විධිවිධාන වලට අනුකූල නොවන පරිදි පිට පළාත් වල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබිය යුතු රු.24,679,520 ක මුද්දර ගාස්තු අයකර ගැනීම වෙනුවෙන් සභාවේ ලේකම් ඇතුළු නිලධාරීන් 07 දෙනෙකු සඳහා දිරි දීමනා වශයෙන් සභා අරමුදලින් අවස්ථා 08 කදී රු.740,386 ක් ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ හා මාසික මහා සභා රැස්වීමේ තීරණය අනුව ගෙවීම් සිදු කරන ලද බව. | වියදම් අවම වන පරිදි ගෙවීම් කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 1980 අංක 47 දරන පාරිසරික පනතේ 23 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන ලැගුම්හල් / භෝජනාගාර, හෝටල් හා බේකරි 447 ක් අදාළ බලපත්‍ර ලබා නොගැනීමෙන් රු.1,788,000 ක ආදායම් අහිමි වී තිබුණි. | මේ වනවිට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු ආයතන පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදු කිරීමට කඩිනමින් කටයුතු කරන බව. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**(ආ) නිශ්ක්‍රීය වත්කම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පිරිවැය හඳුනාගත නොහැකි ට්‍රැක්ටර් ට්‍රේලර් 04 ක තට්ටුව දිරාපත් වී ඇති බැවින් ඒවා අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුදු 04 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | කඩිනමින් අළුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | වත්කම් කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ii) | 2015 වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු ෆොටෝන් කෲ කැබ් රථයේ මුහුණත හා එහි බඳ අලුතින් තැබිය යුතු අතර, එය අළුත්වැඩියා නොකිරීම නිසා අවුරුදු 03 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | අළුත්වැඩියාවට යොමු කිරීමට කටයුතු කරන බව. | වත්කම් කඩිනමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොග්ගල පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීම හා පින්තාරු කිරීමේ කර්මාන්තයේ තාප්පය කපරාරු කිරීම සඳහා සහ කයිරුව නිම කිරීම සඳහා රු.81,833 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ සමිතිය මඟින් අය කර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගත යුතුය. |
| (ආ) | කොග්ගල පොල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.63,742 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අදාළ සමිතිය මඟින් අය කර ගැනීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය අතහැර ගිය, වැඩ තහනමට ලක් වූ හා විශ්‍රාම ගොස් ඇති සේවකයින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂය රු.2,347,905 ක් වූ අතර, එම ණය ශේෂ අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම හිඟ ශේෂය පියවන ලෙස අවසන් සිහි කැඳවීම් ලිපි නිකුත් කර ඇති බව. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |